# නපුරු හා පැංචා



තජිනි උමේධා මුදලිගේ

# නපුරු හා පැංචා

තජිනි උමේධා මුදලිගේ

**ප්‍රථම මුද්‍රණය-2023**

<u>වෙනත් කෘති</u>

කුරුලු රංචුව සහ වඳුරු රංචුව (2020)

**මෙම කෘතියේ සියලු අයිතිය කර්තෘ සතුය.**

ISBN 978-624-208-064-2

කර්තෘ - තජිනි උමේධා මුදලිගේ

කෘතිය - නපුරු හා පැංචා

පිදුම

මාගේ අම්මටයි, තාත්තටයි, මට අකුරු කියා දුන් ගුරුමෑණිවරුන්ටයි මේ පොත පුදමි.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත්  බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි  එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින්  ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු  පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ළදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම  නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා  සේනාධීර

විදුහල්පතිනිය


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023  .  11  . 01

එකමත් එක කැලෑවක පුංචා කියලා හා පැංචෙක් ජීවත් වුණා. එයගේ අම්මයි, තාත්තයි, එයයි විතරයි.



පුංචාට ගොඩක් නපුරු ගතිගුණ තිබුණා. එයා යාළුවන්ට ගහනවා, බනිනවා, හිථ රිද්දනවා වගේ නපුරු වැඩ ගොඩක් කළා. අනික එයා අම්මටයි, තාත්තටයිවත් ගරු කළේ නෑ. ඒ නිසා කවුරුත් එයට කැමති වුණේ නෑ.



එයාට ගුරුවරුවත් ආදරේ කළේ නෑ. එයාට ආදරේ කරපු අය තමයි අම්මයි, තාත්තයි, එයාගේ එකම යාළුවයි විතරයි. එයාගෙ නම චුට්ටා. එයා පුංචා එක්ක ඉඳලම නපුරු ගතිගුණ ඇති වෙලා.



එක දවසක් චුට්ටයි, පුංචයි ළමයෙකුගේ බෑගයට කැරපොත්තෙක් දැම්මා. ළමයා පන්තියට ඇවිත් පොත ගන්න බෑගයට අත දැම්මා. එතකොට ම කැරපොත්තා බෑගයෙන් එළියට පැන්නා.ළමයා බය වුණා. ඒ ළමයට තරහා ගියා. ඒ ළමයා හිතුවා පුංචයි, චුට්ටයිත් තමා මේ දේ කරන්න ඇත්තේ කියලා. මෙහෙම හිතපු ළමයා මේ ගැන ගුරුතුමියට කිවුවා. ගුරුතුමියටත් තරහා ගියා.


ගුරුතුමිය පුංචටයි, චුට්ටටයි හොඳටම දඬුවම් කළා.


චුං චා..
චුට්ටා..

එක දවසක් පුංචට හිතුණා, චූට්ටත් එක්ක ගමරාලගේ ගොවිපලට ගිහිල්ලා මොකක් හරි දඟ වැඩක් කරලා කලබලයක් ඇති කරන්න. පුංචා මේ ගැන චූට්ටට කිව්වා.

"හරි අපි යමු." චූට්ටා කිව්වා. පුංචට මතක් වුණා අම්මා යන්න එපා කිව්වා කියලා. ඒත් පුංචා කියන දේ අහන් නැතුව ගමරාලගේ ගොවිපලට ගියා.

එයාලා ඉක්මනට එළවළු කොටුවට පැන්නා. එතකොට ම එතන හිටපු ගමරලගේ දඩෝරියා බුරාගෙන පුංචාගේ ඇඟට පැන්නා. චූට්ටා පැනලා දිව්වා. එතකොට ම ගමරාල ඇවිත් දඩෝරියාව අල්ලා ගත්තා.



හෝව්

ඊට පස්සේ, "හාවෝ ඔයා දැන් යන්න." කියලා ගමරාල පුංචට කැරට් අලයකුත් දුන්නා. පුංචා ගමරලට ස්තූතියි කරලා එතනින් ගියා.

"මට දැන් හොඳ ගතිගුණ තේරෙනවා. මමත් හොඳ ගතිගුණ එකතු කරගෙන හැමෝම එක්ක සමඟියෙන් ඉන්න ඕනේ." පුංචා හිතුවා. පුංචා මේ ගැන අම්මටයි, තාත්තටයි කිව්වා. මේ ගැන අහලා එයාලත් සතුටු වුණා.



පුංචයි, චුට්ටයි ආයෙමත් දඟ වැඩ කළේ නෑ. ඒ නිසා හැමෝම ඒ දෙන්නට ආදරේ කළා.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01